# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විනිමය පත්‍ර (සංශෝධන)

**(82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2024 අගෝස්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජූලි මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[289 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනතට පොදු සංශෝධනයක් සිදු කරනු ලබන අතර ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ "ලංකාව" යන පදය වෙනුවට "ශ්‍රී ලංකාව" යන පදය ප්‍රතියෝජනය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ තත්කාලය සඳහා අදාළ වන නෛතික අනුප්‍රමාණයට අනුව බිල්පතක පොළිය ගණනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ගෙවීමේ කාලය ගණනය කිරීමේදී, ඒ වගන්තිය යටතේ ලබා දී ඇති සහන කාලසීමාව අත්හිටුවීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් සන්නිවේදනයේ වැඩි දියුණුවීම් සැලකිල්ලට ගනිමින් අභාවිත පරිචයන් ප්‍රධාන ප්‍රඥප්තියෙන් ඉවත් කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පරිච්ඡින්න කරනු ලැබේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් වර්තමාන කෙටුම්පත් කිරීමේ පරිචයන්ට අනුකූල වන පරිදි ව්‍යවස්ථාපිත නීතිය සකස් කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ෆැක්ස් මගින් සම්ප්‍රේෂණය කිරීම මගින් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් අගරු කිරීමේ නිවේදනය ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ආදායකයාගේ නම වෙනස් කිරීම ද වාස්තවික වෙනස් කිරීමක් ලෙසින් සැලකීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ෆැක්ස් මගින් සම්ප්‍රේෂණය කිරීම මගින් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් ගෙවීම සඳහා චෙක්පතක අනුරූපයක් අණ ලත් බැංකුව වෙත යැවීමට බැංකුකරුට හැකියාව ලබා දීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් වර්තමාන කෙටුම්පත් කිරීමේ පරිචයන්ට අනුකූල වන පරිදි ව්‍යවස්ථාපිත නීතිය සකස් කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ චෙක්පතක කවර හෝ එක් පසක රේඛනය කිරීමේ පරිචය ව්‍යවස්ථානුකූලව පිළිගැනීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ගෙවීම් සිදු කරනු ලබන බැංකු සඳහා වූ ආරක්ෂණය වැඩි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර අලුත් වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "පමණි" යන වචනය සහිතව හෝ රහිතව "ආදායකයාගේ ගිණුමට" යනුවෙන් රේඛනය කිරීම ව්‍යවස්ථානුකූලව පිළිගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ගෙවීම් සිදු කරනු ලබන බැංකුකරුවන් සඳහා වූ ආරක්ෂණය වැඩි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මගින් 82අ සිට 82ඊ දක්වා වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර ඒ අලුත් වගන්තිවල නීතියේ බලපෑම වනුයේ යම් චෙක්පත් අගරු කිරීම සඳහා දණ්ඩන සහ වෙනත් ආනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මගින් යම් අභාවිත විධිවිධාන ඉවත් කරමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

## විනිමය පත්‍ර (සංශෝධන)

එල්.ඩී.-ඕ. 10/2024

**(82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක      දරන විනිමය පත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත, ඒ ප්‍රධාන ප්‍රඥප්තියේ "ලංකාව" යන වචනය යෙදෙන කවර හෝ ස්ථානයක ඒ වචනය වෙනුවට "ශ්‍රී ලංකාව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 82 වන අධිකාරය සඳහා වන පොදු සංශෝධනය

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "බැංකුකරු" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

> ""බැංකුකරු" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බැංකු ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද විදේශ බැංකුවක ශාඛාවක් අදහස් වේ;"; සහ

(2) "භාරදීම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

> ""ඉලෙක්ට්‍රොනික ක්‍රමය" යන්නෙන්, මාධ්‍යය කවරක් වුව ද, ඉලෙක්ට්‍රොනික, චුම්භක, දෘෂ්ටික හෝ වෙනත් යම් ඒ හා සමාන ශක්තියක් මගින් තොරතුරක් උත්පාදනය කරන, යවන, ප්‍රතිග්‍රහණය කරන හෝ ගබඩා කරන යම් ක්‍රමයක් අදහස් වේ;

"ෆැක්ස් මගින් සම්ප්‍රේෂණය කිරීම" යන්නෙන්, ලිඛිත, මුද්‍රිත හෝ චිත්‍රාත්මක ලේඛනයක් ප්‍රභා විද්‍යුතය ආධාරයෙන් පරිලෝකනය කර දුරකතන පද්ධතියක් හරහා සම්ප්‍රේෂණය කොට එසේ සම්ප්‍රේෂණය කිරීමෙන් පසුව එහි අනුරූපය ප්‍රතිඋත්පාදනය කිරීම අදහස් වේ;".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "වර්ෂයක් සඳහා සියයට නවයක අනුප්‍රමාණයකින් විය යුතු ය:" යන වචන වෙනුවට "තත්කාලය සඳහා අදාළ වන නෛතික අනුප්‍රමාණය අනුව විය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) සෑම අවස්ථාවකදී ම, බිල්පතෙන් නියම වී ඇති ගෙවීම් කළ යුතු අවසාන දිනයේ දී, හෝ ඒ දිනය ගනුදෙනු සිදු කරනු නොලබන දිනයක් වන්නේ නම්, ඉක්බිතිව ම එළඹෙන ගනුදෙනු සිදු කරනු ලබන දිනයේ දී බිල්පත ගෙවනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කිරීම**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම**

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "නිදසුනක් වශයෙන්," යන වචනවල සිට "යනුවෙන් නියම කර ඇති ආකාරයට ම" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"නිදසුනක් වශයෙන්, "ඩී ට පමණක් ගෙවනු", "එක්ස් ගේ ගණනට ඩී ට ගෙවනු" හෝ "රැස්කිරීම සඳහා ඩී ට හෝ අණ පරිදි හෝ ගෙවනු" යනුවෙන් නියම කර ඇති ආකාරයට ම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) ලිඛිතව හෝ පෞද්ගලික සන්නිවේදනයක් මගින් හෝ ෆැක්ස් මගින් සම්ප්‍රේෂණය කිරීම මගින් හෝ ප්‍රමාණවත් පරිදි බිල්පත හඳුනා ගැනෙන සහ ප්‍රතිග්‍රහණය නොකිරීමෙන් හෝ ගෙවීම් නොකිරීමෙන් හෝ බිල්පත අගරු කරන ලද බව දැනුම් දෙන වෙනත් ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මගින් දැනුම් දීම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "එනම්, දාතමේ" යන වචන වෙනුවට, "එනම්, ආදායකගේ නමේ, දාතමේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) (අ) බැංකුකරුවකු විසින්, ගෙවීම සඳහා චෙක්පත ඉදිරිපත් කිරීම වෙනුවට, චෙක්පතේ නිශ්චිතව දක්වා ඇති ඉලෙක්ට්‍රොනික ගෙවීම් තොරතුරු සමග එහි අනුරූපයක් ෆැක්ස් මගින් සම්ප්‍රේෂණය කිරීම මගින් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මගින් චෙක්පත අණකරන ලද බැංකුකරු වෙත, ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ කාර්ය සඳහා -

(i) චෙක්පතක අනුරූපය, චෙක්පතේ ඉදිරිපස දර්ශනයෙන් සහ පිටුපස දර්ශනයෙන් සමන්විත විය යුතු ය; සහ

(ii) චෙක්පතක ඉලෙක්ට්‍රොනික ගෙවීම් තොරතුරු-

(I) චෙක්පතේ අනුක්‍රමික අංකයෙන්;

(II) චෙක්පත අණකරන ලද බැංකුකරු සහ ශාඛාව හඳුනාගනු ලබන කේතයෙන්;

(III) චෙක්පතේ අණකරුගේ ගිණුම් අංකයෙන්;

(IV) චෙක්පතේ අණකරු විසින් ඇතුළත් කර ඇති පරිදි චෙක්පතින් අණ කරන ලද මුදල් ප්‍රමාණයෙන්; සහ

(V) ගෙවීම්, නිෂ්කාෂන සහ බේරුම් කිරීමේ පද්ධති හා සම්බන්ධ යම් ලිඛිත නීතියක් යටතේ සාදනු ලබන නියෝග මගින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් කාරණයකින්,

සමන්විත විය යුතු ය.

(5) 52 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) (4) වන උපවගන්තිය යටතේ ගෙවීම් සඳහා චෙක්පතක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්; සහ

(ආ) (4) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෙවීම් කරන ලද චෙක්පතක් සම්බන්ධයෙන්,

අදාළ නොවිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ බැංකුකරුවකු විසින් ගෙවීම සඳහා චෙක්පතක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, 45 වන වගන්තියේ විධිවිධාන අදාළ වන ලෙසින් සහ චෙක්පත, ගනුදෙනු සිදු කරනු ලබන දිනයක, නිසි ස්ථානයේ දී හෝ සාධාරණ වේලාවක ඉදිරිපත් කිරීම අවශ්‍ය වන ලෙසින් කියවා තේරුම් නොගත යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා, ඉදිරිපත් කරන ලද චෙක්පතක අනුරූපය, හෝ එහි ඉලෙක්ට්‍රොනික ගෙවීම් තොරතුරු එකක් හෝ ඊට වැඩි ගණනක් වැරදිසහගත වන අවස්ථාවක දී ඒ ඉදිරිපත් කිරීම ශූන්‍ය විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"සාමාන්‍ය රේඛනය සහ විශේෂ රේඛනය අර්ථ නිරූපණය.

**76.** (1) චෙක්පතක මුහුණත හරහට "ගනුදෙනු කළ නොහැකි ය" යන වචන සහිත ව හෝ රහිත ව සමාන්තර තීර්යක් රේඛා දෙකක් එකතු කර ඇති අවස්ථාවක දී, ඒ එකතු කිරීම රේඛනයක් වන අතර, චෙක්පත සාමාන්‍යයෙන් රේඛිත වේ.

(2) චෙක්පතක මුහුණත හරහට "ගනුදෙනු කළ නොහැකි ය" යන වචන සහිත ව හෝ රහිත ව බැංකුකරුවකුගේ නම එකතු කර ඇති අවස්ථාවක දී, ඒ එකතු කිරීම රේඛනයක් වන අතර, චෙක්පත ඒ බැංකුකරුට විශේෂයෙන් රේඛිත වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) චෙක්පතක් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ රේඛනය කර ඇති අවස්ථාවක දී, ධාරකයා විසින්, "ගනුදෙනු කළ නොහැකිය" යන වචන එකතු කරනු ලැබිය හැකි ය."; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "තමාට ම විශේෂයෙන් රේඛනය කර ගත හැකි ය." යන වචන වෙනුවට "තමාට ම විශේෂයෙන් රේඛනය කර ගනු ලැබිය හැකි අතර, රැස්කිරීමේ කාර්යය සඳහා, ඒ රේඛනය චෙක්පතේ මුහුණතෙහි හෝ පිටුපස හෝ සිදු කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ චෙක්පත සඳහා ගෙවීම් කරනු ලබන බැංකුකරු, චෙක්පතේ පිටසනක් නොමැතිවීම හෝ පිටසනෙහි අක්‍රමවත්භාවයක් තිබීම යන හේතු නිසාම පමණක් යම් වගකීමක් දරනු නොලැබිය යුතු අතර, ගෙවීම සිදු කිරීම මත චෙක්පත නිදහස් කෙරෙන්නේ ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"චෙක්පතක් වචන සහිතව රේඛනය කිරීමේ බලපෑම.

**81.** (1) තැනැත්තකු, "ගනුදෙනු කළ නොහැකි ය" යන වචන මතුපිට සඳහන් රේඛිත චෙක්පතක් ලබාගත් අවස්ථාවක දී, ඔහු එය ලබාගත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට චෙක්පත පිළිබඳව තිබූ හිමිකමට වඩා හොඳ හිමිකමක් ඔහුට ලබා ගත නොහැකි අතර, එය ලබාගත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට තිබූ හිමිකමට වඩා හොඳ හිමිකමක් ලබාදීමට ද ඔහුට හැකියාවක් නොමැත්තේ ය.

(2) චෙක්පතක්, එහි මුහුණතෙහි "පමණි" යන වචනය සහිතව හෝ රහිතව "ආදායකයාගේ ගිණුමට" හෝ "ආදායකයාගේ A/C" යන වචන සහිතව රේඛනය කරන ලද හෝ රේඛනය නොකරන ලද අවස්ථාවක දී, ඒ චෙක්පත පවරනු ලැබිය නොහැකි විය යුතු අතර, එය, එහි පාර්ශ්වයන් අතර පමණක් වලංගු විය යුතු ය. ".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ උපවගන්තිය, ඒ උපවගන්තියේ (අ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ නැවත අක්ෂර යොදන ලද (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ආ) බැංකුකරුවකු, චෙක්පතේ පිටසනක් නොමැතිවීම හෝ පිටසනෙහි අක්‍රමවත්භාවයක් තිබීම සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට

අපොහොසත් වීමේ හේතුව නිසාම පමණක්, (අ) ඡේදයේ සඳහන් කාර්යය සඳහා නොසැලකිලිමත් ලෙස ක්‍රියාකර ඇති ලෙසට සලකනු නොලැබිය යුතු ය.”.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 82අ, 82ආ, 82ඇ, 82ඈ, 82ඉ සහ 82ඊ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියට 82අ, 82ආ, 82ඇ, 82ඈ, 82ඉ සහ 82ඊ අලුත් වගන්ති ඇතුළත් කිරීම

"ඇතැම් චෙක්පත් අගරුවීම සම්බන්ධයෙන් දණ්ඩන.

82අ. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ගනුදෙනුකරුවකු, තමා විසින් බැංකුවක පවත්වාගෙන යනු ලබන ගිණුමකින්, යම් ණයක් හෝ වෙනත් බැඳීමක් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් නිදහස් කිරීම සඳහා වෙනත් තැනැත්තකුට ඒ ගිණුමෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා අණ කරන ලද යම් චෙක්පතක්-

(අ) ගරුත්වය සඳහා චෙක්පතට ගෙවීම් කිරීමට එම ගිණුමේ බැරට පවතින මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම;

(ආ) චෙක්පතේ මුදල, බැංකුව සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුමක් අනුව එම ගිණුමෙන් ගෙවීම සඳහා සැළසුම් කරන ලද මුදල් ප්‍රමාණය ඉක්මවා තිබීම;

(ඇ) අණකරු විසින් වසා දැමූ ගිණුමකින් චෙක්පතක් නිකුත් කර තිබීම; හෝ

(ඈ) (3) වන උපවගන්තිය ප්‍රකාරව යම් නීත්‍යානුකූල හේතුවක් නොමැතිව අණකරු විසින් නිකුත් කරන ලද චෙක්පතක් ඔහු විසින් ප්‍රතිනියෝග කර තිබීම,

හේතුවෙන් බැංකුව මගින් නොගෙවා ආපසු එවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා වරදක් සිදු කර ඇති ලෙසට සලකනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, චෙක්පතේ සඳහන් මුදල් ප්‍රමාණයට සමාන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක්

ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (අ) චෙක්පත අණ කරන ලද දින සිට මාස හයක කාලසීමාව හෝ එහි වලංගු කාලසීමාව යන දෙකෙන් කලින් එළඹෙන කාලසීමාව ඇතුළත අණ ලැබූ බැංකුව වෙත චෙක්පත ඉදිරිපත් කර ඇත්නම්;

(ආ) චෙක්පතෙහි ආදායකයා හෝ යථා කාල ධාරකයා විසින්, නොගෙවා ආපසු එවන ලද චෙක්පත සම්බන්ධයෙන් රැස්කරනු ලබන බැංකුවෙන් හෝ අණ ලැබූ බැංකුවෙන් ඔහු වෙත තොරතුරු ලැබීමෙන් දින අනූවක් ඇතුළත, ආපසු එවන ලද චෙක්පතෙහි වටිනාකම ගෙවීම සඳහා චෙක්පතේ අණකරු වෙත ලිඛිතව ඉල්ලීමක් සිදුකළහොත්; සහ

(ඇ) ඒ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් චෙක්පතේ අණකරු විසින්, ඒ ඉල්ලීමේ දිනයේ සිට දින අනූවක් ඇතුළත චෙක්පතේ ආදායකයා හෝ යථා කාල ධාරකයා වෙත ගෙවීම් සිදුකිරීමට අපොහොසත් වන්නේ නම්,

පමණක් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) අණ ලැබූ බැංකුවක් විසින් "අණකරු විමසනු", "ගිණුම වසා ඇත" හෝ "අණකරු විසින් ගෙවීම් ප්‍රතිනියෝග කර ඇත" යන වචන චෙක්පත මත ලිවීමෙන් හෝ රැස්කරනු ලබන බැංකුවක් විසින් නිකුත් කරනු ලබන චෙක්පතක් ආපසු එවීමේ නිවේදනයක ඒ වචන සඳහන් කිරීමෙන් චෙක්පතක් අගරු කර ඇති අවස්ථාවක දී, අණකරුගේ ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් චෙක්පත අගරු කරනු ලැබූ බවට පූර්වනිගමනය කරනු ලැබිය යුතු ය.

**නීති කෘත්‍යයක් ඇරඹීම.**

**82ආ.** අණකරුගේ ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නොගෙවා ආපසු එවන ලද චෙක්පතක ආදායකයා හෝ යථා කාල ධාරකයා විසින්, හිමිකම්පාන්නා වශයෙන්, 82අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉකුත් වී දින තිහක් ඇතුළත නීති කෘත්‍යයක් අරඹනු ලැබිය හැකි ය.

**අධිකරණ බලය.**

**82ඇ.** මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් විභාග කොට නිශ්චය කිරීම සඳහා වන අධිකරණ බලය-

(අ) චෙක්පතේ ආදායකයාගේ හෝ යථා කාල ධාරකයාගේ ගිණුම හරහා රැස්කිරීම සඳහා චෙක්පත තැන්පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ ආදායකයා හෝ යථා කාල ධාරකයා විසින් ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාව පිහිටා ඇති; හෝ

(ආ) චෙක්පතේ ආදායකයා හෝ යථා කාල ධාරකයා විසින් ගෙවීම සඳහා චෙක්පත අණ ලැබූ බැංකු ශාඛාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, අණකරු විසින් ගිණුම පවත්වාගෙන යනු ලබන ඒ අණ ලැබූ බැංකු ශාඛාව පිහිටා ඇති,

අධිකරණ බල ප්‍රදේශය තුළ පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණය වෙත පවරනු ලැබිය යුතු ය.

**අගරු වූ චෙක්පතක තීරණාත්මක සාක්ෂි.**

**82ඈ.** අණකරුගේ ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අගරු වූ චෙක්පතක් පිළිබඳ තීරණාත්මක සාක්ෂි ලෙස පහත සඳහන් කරුණු සලකනු ලැබිය යුතු ය:-

(අ) රැස්කරනු ලබන බැංකුව විසින් නිකුත් කරන ලද චෙක්පත ආපසු එවීමේ නිවේදනය;

(ආ) රැස්කරනු ලබන බැංකුව විසින් පිළිගන්නා ලද තැන්පතු පත්‍රිකාව; හෝ

(ඇ) අණ ලැබූ බැංකුව විසින් ආපසු එවන ලද චෙක්පත.

චෙක්පතේ ආදායකයාගේ හෝ යථා කාල ධාරකයාගේ වාසියට වන පූර්වනිගමනය.

**82ඉ.** පටහැනිව ඔප්පු කරනු ලැබුවහොත් මිස, අණකරුගේ යම් ණයක් හෝ වෙනත් බැඳීමක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් නිදහස් කිරීම සඳහා, චෙක්පතේ ආදායකයා හෝ යථා කාල ධාරකයා වෙත චෙක්පත ලැබුණු බවට පූර්වනිගමනය කරනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන වැරදි.

**82ඊ.** මේ ආඥාපනත යටතේ වූ වරදකට පුද්ගල මණ්ඩලයක් වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වේ නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාගත මණ්ඩලයේ සිටි සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු විසින් ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වේ නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ හවුල් ව්‍යාපාරයේ සිටි සෑම හවුල්කරුවකු විසින් ම; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් වේ නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම පුද්ගලයකු විසින් ම,

එම වරද සිදු කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සංස්ථාගත මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු හෝ ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකු හෝ ඒ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයේ යම් පුද්ගලයකු විසින්, ඒ වරද

සිදු කරනු ලැබ ඇත්තේ ඔහුගේ දැනුමකින් තොරව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කරන ලද බවට අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරන්නේ නම්, ඔහු විසින් ඒ වරද සිදු කරන ලද ලෙසට සලකනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය, එහි "මේ වගන්තියේ කාර්යය සඳහා" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.